# තරගය

**රමණී පෙරේරා**
බන්ඩූරා වික්ටෝරියා

බලාපොරොත්තු පොදිබැඳගෙන ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ බොහෝ අයට විශාල අභියෝග රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ සියලු අභියෝග සම්පූර්ණ කරගත්තාට පසුව තමන්ගෙ ආදායමත් එක්ක ජීවිතය ගෙනයන ආකාරය සැලසුම් කළේ නැත්නම් ආයෙත් ගැටළු සහගත තත්වයකට මුහුණ දෙන්න වෙනවා. මේ තත්වයේදී විශේෂයෙන්ම කාන්තා පක්ෂය තමන්ගෙ පවුල් ඒකකය සමබරව පවත්වාගෙන යන්න ජීවිත සටනට උරදීමක් අවශ්‍ය වෙනවා.

අද සමාජය පුරා පවතින්නේ විශාල තරගයක්. සමහරු මේ තරගයේදී වේගයෙන් ඉදිරියට යනවා. තවත් සමහරු බොහොම මන්දගාමීව උපේක්ෂාවෙන් ජීවිත ගත කරනවා. අන්අය අභිබවා යෑමේ අධිමානසිකත්වයෙන් වැඩ කරන්න ගිහින් කීදෙනෙක් මානසික රෝගීන් බවට පත්වෙලාද? මොහොතකට කල්පනාකර බලන්න. අසල් වැසියාට වටිනා මෝටර් රථයක්, අලංකාර නිවසක්, මේ වගේ භෞතික සම්පත් පස්සෙ දුවන්නන් වාලේ දුවලා හති වැටෙනකොට තමන්ගෙ දරු පවුල් අනාථවෙලා ඉවරයි.

මෙහි තවත් භයානක පැත්තක් තිබෙනවා. සමහරු කුඩාකල සිටම දරුවන්ටත් අධිමානසික තත්වය ආරෝපණය කරනවා. **තමන්ගේ දරුවන් අන් අයගේ දරුවන්ට වඩා දක්ෂ සුවිශේෂී අය බව නිතරම පෙන්වීමට උත්සාහ ගන්නවා.** නොමේරූ මනසට මෙවැනි විෂබීජ ඇතුළු වුනාම ජීවිතයේ කෙදිනක හෝ ලබන පරාජයක් විඳ දරාගැනීමේ ශක්තිය එම දරුවන්ට නැතිව යනවා. දරුවන් කුඩා කල සිටම අන් අයගේ දරුවන්ට ඊර්ෂ්‍යා කිරීම, තරඟ කිරීමට හා අභිබවා යෑමේ තරඟයට පුරුදු පුහුණු කලහොත් ඔහුත් වැඩිහිටි අය බවට පත්වූ විටද එම ආකල්පවල වෙනසක් සිදුවන්නේ නැහැ.

අප ජීවත් වන සංකීර්ණ සමාජයේ විවිධ හැලහැප්පීම් වලට අපට මුහුණදීමට සිදුවෙනවා. සමබර මනසකින් දුක හා සතුට නොසැලී විඳ දරා ගැනීමේ ශක්තිය කුඩාකල සිටම දරුවාට පුරුදු පුහුණු කල යුතුයි. අන්අය කරනදෙය අනුකරණය කරනවාට වඩා තමන්ගේ ආදායමට සරිලන ලෙස වැඩ කිරීමට කාන්තාවන් තරයේ සිත තබාගත යුතුය. ජීවත් වීමත් විභාගයකට සූදානම් වනවා වගේ වැඩක් හරි හැටි සැලසුමක් නැතිව වැඩ කලොත් අවසානය තරගයෙන් .. ..පරාජය!

උනුන් පරයා තරග කරමු
අපි.. .. ..
අන් අයගෙ
දියුණුව නොඉවසමු
අපි.. .. ..
කෙනෙකුට ගරහා
නිරතුරුවම
සතුටුවෙමු.. .. ..
ඇයිද? මිනිසුනේ
සිතන්නට බැරි
මරණින් පසු
අප. .. ..
සියල්ලන්ම.. .. ..
එකම මිහිතලයක
එකම මූල ද්‍රව්‍ය බවට
පත්වන.. .. .. වග.. .. ..




මෙල්බන් පුරවරයේ දිදුලන ගීත තාරකාවියක වන තිලකා රූපසිංහ සිය ප්‍රථම සංගත තැටිය නිකුත් කරන්නට සූදානම්ව සිටි මොහොතේ අපට හමු විය.

කුඩා කල සිට ම ගායනයට දස්කම් පෑ තිලකා පාසලේ විවිධ ප්‍රසංගයන්හිත් ගුවන්විදුලියේත් සිය හැකියාවන් විදහා පෑවා ය. ඇය වසර 17 කට පමණ පෙර ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූවා ය. ඇගේ ප්‍රථම කැසට් පටය වසර 10 කට පමණ පෙර පුර සඳින් නමින් නිකුත් විය. මේ කැසට් පටයේ ගී අතරින් ගී තුනකම රචිකාවිය ද ඇය වූවා ය.

මෙල්බන් පුරයේ විවිධ සංගීත ප්‍රසංග සඳහා සිය දායකත්වය නො-පසුබටව ලබා දුන් තිලකා තමා ගැයූ ගීත 16 ක් එක් කර ඇගේ ප්‍රථම සංගත තැටිය ආරාධනා නමින් නොවැම්බර් 13 වන දා නිකුත් කරන්නට සූදානම්ව සිටියි. මේ සංගත තැටිය සඳහා සමන් චන්ද්‍රනාත් වීරසිංහ, කේශව එදිරිසිංහ, චන්ද්‍රසේන රංගේ, තිලකා රූපසිංහ, කේ ඩී කේ ධර්මවර්ධන, පැතුම් තිලකසිරි හා සිසිර දිසානායක ගීත රචනයෙන් දායක වී ඇත. සරත් දසනායක, මහින්ද බණ්ඩාර හා වික්ටර් රත්නායක යන සංගීතඥයන් ආරාධනා සංගත තැටිය සංගීතවත් කර ඇත..

නොවැම්බර් 13 වන දා සවස 3 ට එපින් මෙමෝරියල් ශාලාවේ දී (මෙල් වේ 182B10) පැවැත්වෙන ආරාධනා සංගත තැටිය නිකුත් කිරීමේ උත්සවයට සහභාගි වන ලෙස ඇය සියලු කලා ලැදි සහෝදර ලාංකියන්ගෙන් ඉල්ලා සිටියි. තිලකා ගේ දුරකථන අංකය 03 9401 4784 වෙයි.

